සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

23 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

12 ශ්‍රේණිය
Grade 12

දේශපාලන විද්‍යාව - I
Political Science - I

පැය දෙකයි
Two hours

**සැලකිය යුතුයි :**

- **මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.**
- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.**
- **එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.**

## A කොටස

■ **අංක 1 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි හෝ ගැළපෙන පිළිතුර තෝරන්න.**

(01) දේශපාලනය විද්‍යාව ස්වාධීන විද්‍යාත්මක ශික්ෂණයක් ලෙස සිය අනන්‍යතාවය තහවුරු කළේ,
1. ක්‍රි. පූ. 3 වන සියවසේ දී ය.
2. ක්‍රි.පූ. 4 වන සියවසේ දී ය
3. ක්‍රි. පූ. 6 වන සියවසේ දී ය
4. ක්‍රි.පූ. 20 වන සියවසේ දී ය.
5. ක්‍රි. ව. 20 වන සියවසේ දී ය. (.............)

(02) දේශපාලනයට බලපෑම් කරන එමෙන්ම සමාජයක දේශපාලන ක්‍රියාවලි සහ වැසියන් විශාල ප්‍රමාණයකගේ දේශපාලන තීරණ, චර්යා හා විඥානය හැඩගස්වන අදහස් සමුච්චය හඳුන්වන්නේ,
1. දේශපාලන ආයතන
2. දේශපාලන භාවිතයන්
3. ආණ්ඩුකරණය
4. දේශපාලන චර්යාව
5. දේශපාලන මතවාද (.............)

(03) දේශපාලනයේ සමාජ පැතිකඩ යන්නට අදාළ නොවන්නේ,
1. දේශපාලන ආයතන
2. දේශපාලන චර්යාව
3. ආගමික මතවාද
4. ආණ්ඩුකරණය
5. දේශපාලන මතවාද (.............)

(04) දේශපාලන විද්‍යාව සම්බන්ධ අතිමූලික ප්‍රශ්නයක් නොවන්නේ,
1. රාජ්‍ය යනු කුමක් ද?
2. රාජ්‍යයේ සම්භවය කෙසේ සිදු වී ද?
3. මරණින් මතු මිනිසුන් කුමක් කරන්නේ ද?
4. දේශපාලනය යනු කුමක් ද?
5. රාජ්‍යයක් අවශ්‍යවන්නේ ඇයි ? (.............)

(05) දාර්ශනික ප්‍රවේශයට අදාළ ප්‍රකාශය තෝරන්න.

1. වඩාත් විද්‍යාත්මක වූ අධ්‍යයන ක්‍රමයකි.
2. සමාජයේ පවතින තත්ත්වය අධ්‍යයනය කරයි.
3. පවතින තත්ත්වය නොව පැවතිය යුතු තත්ත්වය අධ්‍යනය කරයි.
4. වඩාත් ප්‍රායෝගික නිගමන ලබා දෙයි.
5. මුලින්ම මෙම අධ්‍යයන ක්‍රමය භාවිතා කළේ කාල්මාක්ස්ය. (.............)

(06) ස්ත්‍රීවාදී ප්‍රවේශය සම්බධයෙන් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

1. ස්ත්‍රිය දේශපාලනයෙන් බැහැර කළ යුතුය.
2. දේශපාලනය පුරුෂයන්ගේ පමණක් උරුමයකි.
3. දේශපාලන විද්‍යාවේ මූලික සංකල්ප අතරට ස්ත්‍රී පුරුෂ සමාජ භාවය යන්න එකතු කළ යුතුය.
4. ස්ත්‍රී විමුක්තිය යථාර්ථයක් නොවේ.
5. ස්ත්‍රියට දේශපාලන අවබෝධයක් නැත. (.............)

(07) චර්යාවාදී ප්‍රවේශයට අදාළ ප්‍රකාශය තෝරන්න.

1. මෙම අධ්‍යයන ක්‍රමයෙන් සමාන තත්ත්වයන් හඳුනාගත හැකිය.
2. ප්‍රතිමානීය ප්‍රවේශය ලෙස ද හඳුන්වයි.
3. පවතින තත්ත්වය නොව පැවතිය යුතු තත්ත්වය අධ්‍යනය කරයි.
4. වඩාත් විද්‍යාත්මක වූ අධ්‍යයන ක්‍රමයකි.
5. මුලින්ම මෙම අධ්‍යාපන ක්‍රමය භාවිතා කළේ ඇරිස්ටෝටල්ය. (.............)

(08) රාජ්‍ය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. රාජ්‍ය සමාජ සංවිධානයකි.
2. රාජ්‍ය කවදා කෙසේ ආරම්භ වූයේ දැයි නිශ්චිතව කිව නොහැක.
3. රාජ්‍ය මානව සංවිධානයකි.
4. රාජ්‍ය ස්වභාවික සංවිධානයකි.
5. එය සමාජයේ ඇති බලවත්ම සංවිධානයයි. (.............)

(09) ''රාජ්‍ය යනු පන්ති ආයුධයකි.'' යන මතය ඉදිරිපත් කළේ,

1. මහාචාර්ය ගානර් 2. වුඩ්රෝ විල්සන්
3. ඇරිස්ටෝටල් 4. මැක් අයිවර්
5. කාල් මාක්ස් (.............)

(10) දේශපාලනයේ දී වඩාත් වැදගත් ආයතන වනුයේ,

1. අධිකරණ ක්‍රියාවලිය 2. ආණ්ඩුකරණය
3. රාජ්‍යය පරිපාලනය 4. පාලකයන්ගේ ගතිගුණ සහ කුසලතා
5. දේශපාලන න්‍යායන් (.............)

■ **අංක 11 සිට 30 දක්වා වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය හෝ ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.**

(11) දාර්ශනික අධ්‍යයන ක්‍රමය සම්බන්ධයෙන් අදාළ ප්‍රකාශ කාණ්ඩය වනුයේ,

A) දේශපාලන අධ්‍යයනයේ මුල්ම අධ්‍යයන ක්‍රමයයි.

B) මෙම අධ්‍යයන ක්‍රමයේ පුරෝගාමීන් වන්නේ ප්ලේටෝ හා ඇරිස්ටෝටල්ය.

C) ප්‍රතිමානීය ප්‍රවේශය ලෙස ද හඳුන්වයි.

D) 20 වන සියවසේ චින්තකයින් අතර මහත්මා ගාන්ධි, හැනා ඇරෙන්ඩ්ට් වැනි අය ද සිටි

E) මෙම අධ්‍යයනයේ දී දේශපාලන ආයතනයන්ගේ සැබෑ ස්වභාවය අධ්‍යයනය කරයි.

1. ABCD 2. BCDE 3. CDEA

4. DEAB 5. EABC (.............)

(12) චර්යාවාදී අධ්‍යයන ක්‍රමයේ ලක්ෂණ ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A) සමපේක්ෂණය හා සිතාගැනීම් පදනම් කරගත් අධ්‍යන ක්‍රමයකි.

B) ඇමරිකානු දේශපාලන විද්‍යා කණ්ඩායමක් විසින් වර්ධනය කර තිබේ.

C) දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා පැවති සම්ප්‍රදායික අධ්‍යයන ක්‍රමවලට ප්‍රතික්‍රියාවක් ලෙස පැන නැගුණි.

D) ප්‍රත්‍යක්ෂ මූලික සාධක මත විද්‍යාත්මක ක්‍රම යොදාගනිමින් දේශපාලනය අධ්‍යයනය කළයුතු බව එමගින් අවධාරණය කෙරේ.

E) අත්‍යවශ්‍ය අගය කිරීම්වලින් තොර බව

1. ABCD 2. BCDE 3. CDEA

4. DEAB 5. EABC (.............)

(13) දේශපාලන විද්‍යාවේ අධ්‍යයන ප්‍රවේශය සම්බන්ධයෙන් අදාල කාණ්ඩය තෝරන්න.

A) මාක්ස්වාදී ප්‍රවේශය

B) දාර්ශනික ප්‍රවේශය

C) තුළනාත්මක ප්‍රවේශය

D) ස්ත්‍රීවාදී ප්‍රවේශය

E) දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය

1. ABCD 2. BCDE 3. CDEA

4. DEAB 5. EABC (.............)

(14) තුළනාත්මක ප්‍රවේශයේ ලක්ෂණ වලට අදාළ කාණ්ඩය වන්නේ,

A) සංසන්දනාත්මක ස්වරූපයකින් යුක්ත වේ.

B) රටක දේශපාලන ස්ථාවරත්වයට තුඩුදුන් වඩාත් හොඳම ආණ්ඩුක්‍රමය කුමක්දැයි සොයා ගනී.

C) තුළනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ ප්‍රභේද දෙකකි.

D) තම රටේ දේශපාලනය පිළිබඳව මනාව අවබෝධ කරගත හැකිවෙයි.

E) එක් එක් රටවල දේශපාලන ඉතිහාසය දේශපාලන පසුබිම පිළිබඳව අවබෝධකරගත හැකිය.

1. ABCD 2. BCDE 3. CDEA

4. DEAB 5. EABC (.............)

The National e-learning Portal for The General Education

(15) දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A) රාජ්‍යයන් අතර පවතින සම්බන්ධතා අධ්‍යයනය කරයි.

B) දේශපාලන සංකල්ප හා මතවාදයන්ගෙන් යුක්ත වේ.

C) ගණික ස්වභාවයක් ගනී.

D) කලකදී වැදගත් වන තේමාවක් තවත් කලක දී නොවැදගත් විය හැකිය.

E) විෂය ක්ෂේත්‍රය ඒකීය ස්වභාවයක් ගනීයි.

1. ABCD 2. BCDE 3. CDEA

4. DEAB 5. EABC (.............)

(16) දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A) දේශපාලන න්‍යාය

B) දේශපාලන මතවාද

C) ලෝක දේශපාලනය

D) දේශපාලන ආයතන

E) ආර්ථික විද්‍යා න්‍යායන්

1. ABCD 2. BCDE 3. CDEA

4. DEAB 5. EABC (.............)

(17) ගැටුම යන්නට අදාළ ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

A) සාධනීය මෙන්ම නිශේධනීය විය හැකිය.

B) ප්‍රතිවිරුද්ධ පාර්ශව අතර පැන නගී.

C) සැමවිටම විනාශකාරී පමණක් වේ.

D) ප්‍රතිවිරුද්ධ පාර්ශවකරුවන් අනතුරු හා අලාභහානි කර ගැනීම

E) මානව සමාජයේ පැවැත්ම සඳහා ගැටුම අවශ්‍ය වේ.

1. ABCD 2. BCDE 3. CDEA

4. DEAB 5. EABC (.............)

(18) ලිබරල් මතවාදයට අනුව දේශපාලන භාවිතයන් වන්නේ,

A) නිදහස් මැතිවරණ

B) දේශපාලන බලයට සීමා පැනවීම

C) පුද්ගල නිදහස සහතික කිරීම

D) අයිතිවාසිකම් අහිමි කිරීම

E) ආගම හා රාජ්‍යය වෙන් කිරීම

1. ABCD 2. BCDE 3. CDEA

4. DEAB 5. EABC (.............)

(19) ස්වාධිපතිත්වය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A) රාජ්‍යයෙන් පමණක් භුක්ති විඳින උසස්ම හා උත්තරීතර බලය වේ.

B) අභ්‍යන්තර හා බාහිර වශයෙන් දෙයාකාර බව විග්‍රහ කර ඇත.

C) රාජ්‍යයේ වැදගත්ම හා විශේෂිතම අංග ලක්ෂණ වේ.

D) රාජ්‍යයේ ආත්මය වන අතර බලාධිකාරී බලය යෙදවීමට රජයට සුජාතභාවය සැපයෙන සාධක වේ.

E) ප්‍රබල රාජ්‍යයන් දුබල රාජ්‍යයන්ගෙන් වෙන් කර ඇත.

1. ABCD 2. BCDE 3. CDEA

4. DEAB 5. EABC (.............)

(20) සමාජ සම්මුතිවාදය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A) ජෝන් ලොක් දක්වන ප්‍රකෘති සමාජය හා තෝමස් හොබ්ස් දක්වන ප්‍රකෘති සමාජ අතර වෙනසක් දක්නට නැත.

B) රාජ්‍යයට පැවති දිව්‍යමය උපත සමාජමය උපතක් බවට පත් කළේ සමාජ සම්මුති වාදයයි.

C) රාජ්‍යය සමාජ ගිවිසුමක ප්‍රතිඵලයක් ලෙස ප්‍රභවය ලබයි.

D) සිවිල් සමාජය තුළ දී රාජ්‍යය බිහි වේ.

E) පසුකාලීන දේශපාලන මතවාද සඳහා සමාජ සම්මුතිවාදය හේතු විය.

1. ABCD 2. BCDE 3. CDEA

4. DEAB 5. EABC (.............)

(21) ආණ්ඩුව පිළිබඳ ඉදිරිපත් ව ඇති නිර්වචන කිහිපයක් වන්නේ,

A) මිනිස් සමාජය පාලනය හා පරිපාලනය කරන ආයතනය

B) මිනිස් සමාජය පාලනය කරන ආයතනය

C) මිනිස් සමාජය කළමනාකරණය කරන සංවිධානය

D) රාජ්‍ය පාලනය කිරීම සඳහා සහභාගී වන පුද්ගල කණ්ඩායම් අන්තර්ගත සංවිධානය

E) රාජ්‍යයේ දේශසීමාව තුළ ජීවත් වන සියලුම දෙනා නියෝජිතය කරන සංවිධානය

1. ABCD 2. BCDE 3. CDEA

4. DEAB 5. EABC (.............)

(22) නිර්බාදවාදී රාජ්‍ය ක්‍රමයේ ලක්ෂණයක් නොවන්නේ,

A) පුද්ගලවාදය

B) රාජ්‍ය ආර්ථික කටයුතුවලින් සම්පූර්ණයෙන් ඉවත් වීම

C) නිදහස් තරඟකාරී ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක වීම.

D) සමාජ සුබසාධනය ඉහළ නැංවීම

E) රාජ්‍යයේ කාර්ය වන්නේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම.

1. ABCD 2. BCDE 3. ABDE

4. ACDE 5. ABCE (.............)

(23) සංධිය ආණ්ඩු ක්‍රමයට අදාළ වන්නේ,

A) මධ්‍යම ආණ්ඩුවකින් හා ප්‍රාන්ත ආණ්ඩු කිහිපයකින් සමන්විත වීම.

B) බලය බෙදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම සිදු කර තිබීම.

C) විවිධත්වය තුළ ඒකීයත්වය ළඟාකර ගැනීමට උපකාරී වීම.

D) ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට උපකාරී වීම.

E) ආණ්ඩුවේ කාර්යයන් දෙවරක් කිරීම ඉන් අවම කරගනු ලැබේ.

1. ABCD     2. BCDE     3. CDEA

4. DEAB     5. EABC     (.............)

(24) රාජ්‍ය පිළිබඳ මාක්ස්වාදී මතයට ගැළපෙන්නේ,

A) මිනිස් වර්ගයාගේ සමස්ත ඉතිහාසට පුරාම රාජ්‍ය පැවති ඇත.

B) එය සමාජ සුභසාධන සංවිධානයක් නොවේ.

C) රාජ්‍ය පංති අරගලයේ ප්‍රතිඵලයකි.

D) කොමියුනිස් සමාජයක් තුළ රාජ්‍ය වියැකී යයි.

E) එය ඇති - නැති සංකල්පය ලොවට දායාද කළේ ය.

1. ABCD     2. BCDE     3. CDEA

4. DEAB     5. EABC     (.............)

(25) අවම රාජ්‍ය සංකල්පය හා නිවැරදි ප්‍රකාශ තෝරන්න.

A) 1970 ගණන් වලින් පසුව ජාතික රාජ්‍ය ක්‍රමය ආශ්‍රිතව වර්ධනය වේ.

B) රාජ්‍යය හැකිතාක් දුරට ආර්ථික කටයුතු කෙරෙහි මැදිහත් වෙයි.

C) රාජ්‍යය කළමනාකරුවෙකු ලෙස ක්‍රියා කරයි.

D) මිල්ටන් ෆ්‍රීඩ්මාන්ගේ ධනවාදය හා නිදහස යන ආර්ථික දර්ශනය අවම රාජ්‍යය සංකල්පයට න්‍යායික පසුබිම සැපයීම

E) නිර්බාධවාදී රාජ්‍යය හා සුභසාධන රාජ්‍යයන් අතර මැද අවස්ථාව අවම රාජ්‍යයයි.

1. ABCD     2. BCDE     3. CDEA

4. DEAB     5. EABC     (.............)

(26) දේශපාලන විද්‍යාව අධ්‍යයනයට අදාළ ආණ්ඩු වන්නේ,

A) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු

B) ධනවාදී ආණ්ඩු

C) ඒකීයවාදී ආණ්ඩු

D) ප්‍රාදේශීය ආණ්ඩු

E) සමූහාණ්ඩුවාදී ආණ්ඩු

1. ABCD     2. BCDE     3. CDEA

4. DEAB     5. EABC     (.............)

The National e-learning Portal for The General Education

(27) දේශපාලන පක්ෂවලට අදාළ කාණ්ඩය තෝරන්න.

A) ප්‍රජාතන්ත්‍රවාදයට අත්‍යවශ්‍ය අංගයකි.

B) දේශපාලන පක්ෂ දීර්ඝ ඉතිහාසයකට හිමිකම් නොකියයි.

C) 19 වන සියවසේ මැද භාගයේ දී යුරෝපයේ දී ආරම්භ විය.

D) සමාජවාදී රටවල දේශපාලන පක්ෂ දැකගත නොහැකිය.

E) දේශපාලන පක්ෂ ජනතාව සංවිධානය කරයි.

1. ABCD    2. BCDE    3. CDEA

4. DEAB    5. EABC    (.............)

(28) නූතනයේ දැකිය හැකි දේශපාලන පක්ෂ වර්ගීකරණයට අයත් වන්නේ,

A) කේඩර පක්ෂ

B) වාමාංශික පක්ෂ

C) මහජන මතය හැඩගස්වන පක්ෂ

D) දැඩි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ

E) දක්ෂිණාංශක පක්ෂ

1. ABCD    2. BCDE    3. CDEA

4. DEAB    5. EABC    (.............)

(29) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයට අදාළ වන කාණ්ඩය තෝරන්න.

A) ඒකාධිපතිවාදයට එරෙහිව මිනිස් නිදහස තහවුරු කිරීම උදෙසා නිර්මාණය විය.

B) පාලකයන් සතු බලය අසීමිත කරන ලදී.

C) මහජනතාව උත්තරීතර කොට සලකයි.

D) මහජනතාව නියෝජිතයන් හරහා පාලනය ගෙන යයි.

E) ධනවාදී ආර්ථිකය හා බැඳී පවතියි.

1. ABCD    2. BCDE    3. CDEA

4. DEAB    5. EABC    (.............)

(30) සමාජවාදී රාජ්‍ය ක්‍රමයට අදාළ වන කාණ්ඩය තෝරන්න.

A) ධනවාදයට හා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයට විකල්පපයක් ලෙස බිහි විය.

B) නිර්ධන පංතියේ විමුක්තිය උදා කිරීම අරමුණයි.

C) රාජ්‍යය පන්ති ආයුධයක් ලෙස සලකයි.

D) තරඟකාරී පක්ෂ ක්‍රමයක් පවතියි.

E) පන්ති රහිත සමාජයක් නිර්මාණය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වේ.

1. ABCD    2. BCDE    3. CDEA

4. DEAB    5. EABC    (.............)

The National e-learning Portal for The General Education

## B කොටස

■ **කෙටි පිළිතුරු සපයන්න.**

(31) දේශපාලන විද්‍යාවේ පියා සහ නූතන දේශපාලන විද්‍යාවේ පියා කවුරුන් ද?

1. ..........

2. ..........

(32) පහත සඳහන් කෘති රචනා කරනු ලැබූ චින්තකයන් දෙදෙනා නම් කරන්න.

1. ජනරජය - ..........

2. කුමාරයා - ..........

(33) බලය බෙදීම අනුව ආණ්ඩු වර්ග වන ආකාර දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

(34) සමාජ සම්මුතිවාදීන් දෙදෙනෙකු නම් කරන්න.

1. ..........

2. ..........

(35) දේශපාලන පක්ෂයක කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

(36) නූතන භෞමික රාජ්‍යය ප්‍රධාන අංග හතරක් යටතේ සංවිධානගත කොට තිබේ. ඉන් දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

(37) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක ප්‍රධාන අංග ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

(38) පැසිස්ට්වාදී පාලකයින් දෙදෙනකු නම් කරන්න.

1. ..........

2. ..........

e තක්සලාව TM The National e-learning Portal for The General Education

(39) ස්වාධිපත්‍ය ප්‍රධාන පැතිකඩ දෙකකින් සමන්විත වේ. ඒවා නම් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

(40) ගැටුම්වල නිශේධනීය පැතිකඩ දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

(41) රාජ්‍යය හා ආණ්ඩුව අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

(42) ඒකීය රාජ්‍යයන් හා සංඝීය රාජ්‍යයක් නම් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

(43) ලිබරල්වාදය ප්‍රභේද තුනක් ඔස්සේ හඳුනා ගැනීමට හැකිය. දෙකක් සඳහන් කරන්න.

The National e-learning Portal for The General Education

1. ..........................................................................................

2. ..........................................................................................

(44) ඉන්දියානු නිරාගමික වාදයේ මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

(45) ස්ත්‍රී වාදයේ ප්‍රධාන ධාරා දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

(46) ජාත්‍යන්තර සංවිධාන දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

(47) බලපෑම් කණ්ඩායම් දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

(48) කෝල්බෲක් ආණ්ඩුක්‍රමය මෙරටට හඳුන්වාදීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපානු ලැබූ හේතු සාධක දෙක සඳහන් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

(49) සීමිත ඡන්ද බලය හා සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ දෙක පිළිවෙලින් සඳහන් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

(50) 2010 වර්ෂයේ දී හා 2015 වර්ෂයේ දී ගෙන එනු ලැබූ ව්‍යවස්ථා සංශෝධන දෙක සඳහන් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

23 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

| | | |
|---|---|---|
| 12 ශ්‍රේණිය<br>Grade 12 | දේශපාලන විද්‍යාව - II<br>Political Science - II | පැය තුනයි<br>Three hours |

**සැලකිය යුතුයි :**

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.**
- **පළමුවැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක් ද, දෙවැනි කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකක් ද, තුන්වෙනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## I කොටස

(01) ''දේපාලනය යනු පුරවැසියන්ගේ සමාජ ජීවිතයේ ප්‍රධාන පැතිකඩකි.'' සාකච්ඡා කරන්න.

(02) ඕනෑම දේශපාලන අධ්‍යනය ප්‍රවේශ දෙකක් විස්තර කරන්න.

(03) පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් සාකච්ඡා කරන්න.

i. රාජ්‍යය හා සමාජය
ii. රාජ්‍ය හා පුරවැසියා
iii. පැසිස්ට්වාදී රාජ්‍ය
iv. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මූලික ලක්ෂණ
v. අවම රාජ්‍ය

## II කොටස

(02) කෝල්බෲක් ආණ්ඩුක්‍රම යටතේ කෝල්බෲක් යෝජනා කෙටියෙන් විස්තර කරන්න.

(05) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ සර්වජන ඡන්ද බලය ප්‍රධානය කිරීමට බලපෑ හේතු සාධක කෙටියෙන් විස්තර කරන්න.

(06) සෝල්බරී ආණ්ඩුක්‍රමය තුළ දක්නට ලැබුණු මූලික අංග ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

(07) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය පිළිබඳව කෙටි විවරණයක් සපයන්න.

## III කොටස

(08) ගැටුම්වල සාධනීය හා නිශේධනීය පැතිකඩ පිළිබඳව සාකච්ඡා කරන්න.

(09) බලපෑම් කණ්ඩායම්වල වැදගත්කම පිළිබඳව කෙටි විවරණයක් සපයන්න.

(10) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් අනුගමනය කරන මූලධර්ම මොනවාදැයි පැහැදිලි කරන්න.

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු

**12 ශ්‍රේණිය** **දේශපාලන විද්‍යාව** **විසඳුම් පත්‍රය**

## I - පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. - 2 | 02. - 5 | 03.- 3 | 04.- 3 | 05.- 3 | 06. - 3 | 07. - 4 | 08. - 4 | 09. - 5 | 10. - 2 |
| 11. - 1 | 12. - 2 | 13. - 2 | 14. - 4 | 15. - 1 | 16. - 1 | 17. - 4 | 18. - 5 | 19. - 5 | 20. - 2 |
| 21. - 1 | 22. - 5 | 23. - 1 | 24. - 2 | 25. - 3 | 26. -5 | 27. - 5 | 28. - 5 | 29. - 3 | 30. - 5 |

## B කොටස

31. 1. ඇරිස්ටෝටල් 2. නිකලෝ මැකියාවලී

32. 1. ප්ලේටෝ 2. නිකලෝ මැකියාවලී

33. 1. ඒකීය ආණ්ඩුක්‍රමය
සංඝීය ආණ්ඩුක්‍රමය
2. සහසංඝීය ආණ්ඩුක්‍රමය

34. 1. තෝමස් හොබ්ස්
ජෝන් ලොක්
2. ජීන් ජැක්විස් රූසෝ

35. 1. විසිරී ඇති ජනමතය ඒකරාශී කිරීම
සමාජ බලය අධිකාරී බලය බවට පත් කිරීම
2. නායකයින් පුහුණු කිරීම
ජනතාව දේශපාලන වශයෙන් දැනුවත් කිරීම

36. 1. නිශ්චිත භූමිය
ජනගහනය
2. ආණ්ඩුව
ස්වාධිපත්‍ය

37. 1. නීතියේ ආධිපත්‍යය
නිදහස් හා සාධාරණ මැතිවරණ
2. ස්වාධීන අධිකරණය
නිදහස් ජනමාධ්‍ය

38. 1. ඇඩොල්ෆ් හිට්ලර් 2. බෙනිටෝ මුසෝලිනී

39. 1. අභ්‍යන්තර ස්වාධිපත්‍ය 2. බාහිර ස්වාධිපත්‍ය

40. 1. ජීවිත හානි
2. දේපල හානි

41. 1. ආණ්ඩුව විවේචනය කළ හැකි වීම
රාජ්‍ය පරිපූර්ණ වස්තුවක් වීම
2. රාජ්‍ය අදෘශ්‍යමාන වේ.
ආණ්ඩුව දෘශ්‍යමාන වේ.

ගුරුගෙදර The National e-learning Portal for The General Education

42. 1. ප්‍රංශය
    2. ඇමරිකා එක්සත් ජනපදය

43, 1. සම්භාව්‍ය ලිබරල්වාදය
    නූතන ලිබරල්වාදය
    2. නව ලිබරල්වාදය

44. 1. සෑම ආගමනයකටම අපක්ෂපාතීව සැලකීම (ධර්ම නිපේක්ෂතා)
    2. සෑම ආගමක්ම එක සමාන බව පිළිගැනීම (සර්ව ධර්ම සම්භාව)

45. 1. ලිබරල් ස්ත්‍රීවාදය
    සමාජවාදී ස්ත්‍රීවාදය
    2. රැඩිකල් ස්ත්‍රීවාදය
    පශ්චාත් නූතන වාදය

46. 1. එක්සත් ජාතීන්ගේ සංවිධානය
    2. සාර්ක් සංවිධානය

47. 1. රාජ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය
    පෞද්ගලික බස්රථ හිමියන්ගේ සංගමය
    2. සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
    ලංකා වාණිජ මණ්ඩලය

48. 1. ලංකාවෙන් ලැබූ ආදායම අඩු වීම
    2. වියදම වැඩි වීම

49. 1. 1910 කෲව් මැකලම් ආණ්ඩු ක්‍රමය
    2. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය

50. 1. 18 වන ව්‍යවස්ථා සංශෝධනය
    2. 19 වන ව්‍යවස්ථා සංශෝධනය

The National e-learning Portal for The General Education